# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරුසිසු අත්වැල

(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)

# ගිණුම්කරණය - 33

## නිපුණතාව 06

කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.


අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය : ගාමිණී හරිස්චන්ද්‍ර මයා

ර/ විද්‍යාලෝක මධ්‍ය මහා විද්‍යාලය



වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය

## කේවල ස්වාමි ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම

| නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල |
|---|---|---|
| 6.1 කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශනවල වැදගත්කම පැහැදිලි කරයි. | • මූල්‍ය ප්‍රකාශන<br>• ආදායම් ප්‍රකාශනය<br>• මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | • කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන නම් කරයි.<br>• කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යතාව පැහැදිලි කරයි |
| 6.2 කේවල ස්වාමි ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි | • ගැළපිලි<br>• අවසන් තොගය ගැළපීම<br>• ලැබිය යුතු ආදායම් සහ කලින් ලද ආදායම්<br>• උපචිත වියදම් සහ ඉදිරියට ගෙවූ වියදම්<br>• බොල් ණය<br>• අඩමාණ ණය ප්‍රතිපාදන<br>• මුදල් හෝ භාණ්ඩ ගැනිලි<br>• දේපල හෝ පිරියත හා උපකරණ ක්ෂය<br>• තොග හානි හා තොග පරිත්‍යාග<br>• සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාරකාර අරමුදල් දායකත්වය<br>• එකතු කළ අගය මත බදු<br>• විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද භාණ්ඩ | • ගිණුම් කාලච්ඡේදයේ අවසන් දිනට තොගය ගැළපුම් කරයි.<br>• ලැබිය යුතු ආදායම හා කලින් ලද ආදායම් ගැළපුම් කරයි.<br>• උපචිත වියදම් හා ඉදිරියට ගෙවූ වියදම් ගැළපුම් කරයි.<br>• බොල්ණය ගැළපුම් කරයි.<br>• අඩමාන ණය ප්‍රතිපාදන ගැළපුම් කරයි.<br>• ගැනිලි ගැළපුම් කරයි.<br>• දේපල පිරියත හා උපකරණ ක්ෂයවීම්, ගැළපුම් කරයි.<br>• තොග හානි, තොග පරිත්‍යාග ගැළපුම් කරයි.<br>• සේවක අර්ථසාධක අරමුදල් දායකය ගැළපුම් කරයි.<br>• සේවා භාරකාර දායකය ගැළපුම් කරයි.<br>• එකතු කළ අගය මත බදු ගැළපීම<br>• විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද භාණ්ඩ සම්බන්ධ ගැළපුම් කරයි.<br>• ගිණුම් කාලච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශනය ද කාලච්ඡේදයේ අවසාන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ද, පිළියෙල කරයි. |

**6.0 කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**සංකල්ප සිතියම**



## කේවල ස්වාමී ව්‍යාපාරයක පිළියෙළ කරන මූල්‍ය ප්‍රකාශන

1 ආදායම් ප්‍රකාශය

2 මූල්‍ය තත්ව ප්‍රකාශය

.................................... ව්‍යාපාරයේ ....................................... දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය / ලාභ හෝ අලාභ ප්‍රකාශනය

| | | | (රු.) |
|---|---|---|---|
| විකුණුම් | | | ××× |
| ආපසු එවුම් | | | (××) |
| | | | ××× |
| **විකුණුම් පිරිවැය** | | | |
| ආරම්භක තොගය | | ×× | |
| ගැනුම් | ××× | | |
| ආපසු යැවුම් | (××) | | |
| ගෙන ඒමේ කුලී | ×× | | |
| පැටවීමේ හා බෑමේ කුලී | ×× | ××× | |
| | | ××× | |
| අවසාන තොගය | | (××) | (×××) |
| දළ ලාභය / අලාභය | | | ××× |
| **වෙනත් ආදායම්** | | | |
| ලද වට්ටම් | | ×× | |
| ආයෝජන ආදායම් | | ×× | |
| දේපළ පිරියත හා උපකරණ විකිණීමේ ලාභය | | ×× | ×× |
| **බෙදාහැරීමේ වියදම්** | | | |
| ප්‍රචාරණ වියදම් | ×× | | |
| බොල් ණය | ×× | | |
| දුන් වට්ටම් | ×× | | |
| බෙදාහැරීමේ රථ ක්ෂය | ×× | | |
| විකුණුම් කොමිස් | ×× | ×× | |
| **පරිපාලන වියදම්** | | | |
| සේවක වැටුප් හා වේතන | ×× | | |
| ගොඩනැගිලි කුලී හා වරිපනම් | ×× | | |
| විදුලිය වියදම් | ×× | | |
| රක්ෂණ ගාස්තු | ×× | | |
| ලී බඩු ක්ෂය | ×× | | |
| ගොඩනැගිලි ක්ෂය | ×× | ×× | |
| **වෙනත් වියදම්** | | | |
| තොග කපා හැරීම | ×× | | |
| තොග හානි | ×× | | |
| පරිත්‍යාග | ×× | ×× | |
| **මූල්‍ය වියදම්** | | | |
| බැංකු ගාස්තු | ×× | | |
| ණයපොළී | ×× | | |
| අයිරා පොළී | ×× | ×× | (×××) |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන ගියා | | | ××× |

................................ ව්‍යාපාරයේ 2019 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | | | (රු.) |
|---|---|---|---|
| | පිරිවැය | සමුච්චිත ක්ෂය | ධාරණ අගය |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ඉඩම් | ××× | - | ××× |
| ගොඩනැගිලි | ××× | ×× | ××× |
| මෝටර් රථ | ××× | ×× | ××× |
| යන්ත්‍ර උපකරණ | ××× | ×× | ××× |
| ලී බඩු හා සවි කිරීම් | ××× | ×× | ××× |
| | ××× | ×× | ××× |
| ආයෝජන | | | ×× |
| **ජංගම වත්කම්** | | | |
| අවසාන තොගය | | ××× | |
| ණයගැතියෝ/වෙළෙඳ ලැබිය යුතු දෑ | ××× | | |
| අඩමාන ණය වෙන් කිරීම | (××) | ××× | |
| ඉදිරියට කළ වියදම් | | ×× | |
| ලැබිය යුතු ආදායම් | | ×× | |
| මුදල් | - | ××× | ××× |
| **මුළු වත්කම්** | | | ××× |
| **හිමිකම හා වගකීම්** | | | |
| ප්‍රාග්ධනය | - | ××× | - |
| ශුද්ධ ලාභය | | ××× | - |
| | | ××× | - |
| ගැනිලි | | (××) | × ×× |
| **ජංගම නොවන වගකීම්** | | | |
| දිගු කාලීන බැංකු ණය | | | ××× |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියෝ/වෙළෙඳ ගෙවිය යුතු දෑ | | ×× | |
| උපචිත වියදම් | | ×× | |
| ඉදිරියට ලද ආදායම් | | ×× | |
| උපචිත EPF | | ×× | |
| උපචිත ETF | | ×× | |
| උපචිත VAT | | ×× | |
| බැංකු අයිරාව | | ×× | ××× |
| **මුළු හිමිකම හා වගකීම්** | | | ×××× |

ඉහත දක්වූ ආදායම් ප්‍රකාශනය තිරස් ආකාරයට ගිණුමක් ලෙස ද, ඉදිරිපත් කළ හැකිය. එවිට මෙය වෙළෙඳ හා ලාභාලාභ ගිණුම නමින් නම් කරනු ලැබේ.

................................... ව්‍යාපාරයේ ................................ දිනෙන් අවසන් වර්ෂය සඳහා

වෙළෙඳ හා ලාභාලාභ ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | (රු.) |
| ආරම්භක තොගය | | ××× | විකුණුම් | | ××× |
| ගැනුම් | ××× | | ආපසු එවුම් | | (××) |
| ආපසු යැවුම් | (××) | | | | ××× |
| ගෙන ඒමේ කුලී | ×× | | | | |
| පැටවුම් කුලී හා බෑමේ කුලී | ×× | | | | |
| | | ××× | | | |
| අවසාන තොගය | | (××) | | | |
| විකුණුම් පිරිවැය | | ××× | | | |
| දළ ලාභය ප/ගෙ | | ××× | | | |
| | | ××× | | | ××× |
| බෙදා හැරීමේ වියදම් | | | දළ ලභය ඉ/ගෙ | | ××× |
| ප්‍රචාරණ වියදම් | ×× | | වෙනත් ආදායම් | | |
| බොල් ණය | ×× | | ලද වට්ටම් | ×× | |
| දුන් වට්ටම් | ×× | | ආයෝජන ආදායම් | ×× | |
| බෙදාහැරීමේ රථ ක්ෂය | ×× | | දේපළ පිරියත හා උපකරණ | | |
| විකුණුම් කොමිස් | ×× | ××× | විකිණීමේ ලාභ | ×× | ×× |
| පරිපාලන වියදම් | | | | | |
| සේවක වැටුප් හා වේතන | ×× | | | | |
| ගොඩනැගිලි කුලී හා වරිපනම් | ×× | | | | |
| විදුලිය වියදම් | ×× | | | | |
| රක්ෂණ ගාස්තු | ×× | | | | |
| ලී බඩු ක්ෂය | ×× | | | | |
| ගොඩනැගිලි ක්ෂය | ×× | ××× | | | |
| වෙනත් වියදම් | | | | | |
| තොග කපා හැරීම | ×× | | | | |
| තොග හානි | ×× | | | | |
| පරිත්‍යාග | ×× | ×× | | | |
| මූල්‍ය වියදම් | | | | | |
| ණය පොලී | ×× | | | | |
| අයිරා පොලී | ×× | ×× | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන ගියා | | ××× | | | ××× |

**තනි පුද්ගල ව්‍යාපාර අභ්‍යාස 01)**

**දේවන්ගේ ව්‍යාපාරයේ 2020/03/31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.**

| ගිණුමේ නම | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| **මුදල්** | **80 000** | |
| **බැංකු නය** | | **50 000** |
| **විකුණුම්** | | **57 000** |
| **විකුණුම් පිරිවැය** | **22 000** | |
| **සේවක වැටුප්** | **12 000** | |
| **විදුලි බිල්** | **8 000** | |
| **ප්‍රාග්ධනය** | | **150 000** |
| **ගොඩනැගිලි පිරිවැය** | **120 000** | |
| **ආයෝජන (දීගුකාලින)** | **10 000** | |
| **භාණ්ඩ තොගය (2020-03-31)** | **5 000** | |
| | **257 000** | **257 000** |

**අතිරේක තොරතුරු :**

1. 2020/03/31 දිනට ගෙවිය යුතු විදුලි බිල රු. 2 000 සහ ඉදිරියට ගෙවා ඇති වැටුප් රු. 4 000 කි.
2. ගොඩනැගිලි පිරිවැය මත වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරන්න.

**අවශ්‍ය වන්නේ**

**1 2020-12-31 න් අවසන් වර්ෂය සදහා ආදායම් ප්‍රකාශය**

**2 2020-12-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

(තනි පුද්ගල ව්‍යාපාර අභ්‍යාස 02)

සමන්සිරිගේ ව්‍යාපාරයේ 2020/03/31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| ගිණුමේ නම | රු | රු |
|---|---|---|
| ගැණුම් | 150000 | _ |
| විකුණුම් | _ | 350000 |
| 2019-04-01 තොගය | 60000 | _ |
| ආපසු එවුම් | 5000 | _ |
| ආපසු යැවුම් | _ | 7000 |
| ගෙනඒමේ කුලී | 8000 | _ |
| ප්‍රචාරණය වියදම් | 10000 | _ |
| විදුලි වියදම් | 5000 | _ |
| වැටුප් හා වේතන | 15000 | _ |
| 10% බැංකු ණය | _ | 120000 |
| ලී බඩු පිරිවැය | 50000 | _ |
| ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය | 300000 | _ |
| වෙළඳ ලැබියයුතු දෑ | 100000 | _ |
| වෙළඳ ගෙවියයුතු දෑ | _ | 70000 |
| මෝටර් රථ පිරිවැයට | 250000 | _ |
| ගෙවල් කුලී ආදායම් | _ | 50000 |
| මුදල් | 144000 | _ |
| ප්‍රාග්ධනය | _ | 500000 |
| | **1097000** | **1097000** |
| | | |

අතිරේක තොරතුරු :

1. 2020/03/31 දිනට ව්‍යාපාරයේ තිබූ තොගය රු. 80 000 කට අගය කර ඇත.
2. 2020-03-31 දිනට උපචිත වියදම්

   විදුලි ගාස්තු 3 000 යි ප්‍රචාරණ වියදම් රු 5 000 යි.
3. අයිතිකරු රු. 2 000 ක් වටිනා භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගෙන ගොස් ඇත.
4. ලී බඩු / මෝටර් රථ වාර්ෂිකව පිරිවැය මත පිළිවෙලින් 5% හා 10% බැගින් ක්ෂය කරන්න.

අවශ්‍ය වන්නේ

1 2020-03-31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

2 2020-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

## (තනි පුද්ගල ව්‍යාපාර අභ්‍යාස 03)

ආසිරිගේ ව්‍යාපාරයේ 2020/03/31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

රු(000)

| ගිණුමේ නම | රු | රු |
|---|---|---|
| ඉඩම් පිරිවැය | 1000 | _ |
| ගොඩනැගිලි පිරිවැය | 800 | |
| මොටර් රථ පිරිවැය | 1200 | |
| සමුච්චිත ක්ෂය 2019-04-01 දිනට | | |
| ගොඩනැගිලි | | 120 |
| මෝටර් රථ | | 200 |
| ගැණුම් හා විකුණුම් | 500 | 1200 |
| ආපසු එවුම් | 30 | _ |
| ආපසු යැවුම් | _ | 20 |
| ගෙනඒමේ කුලී | 40 | _ |
| ප්‍රචාරණය වියදම් | 50 | _ |
| විදුලි වියදම් | 30 | _ |
| වැටුප් හා වේතන | 60 | _ |
| 10% බැංකු ණය | _ | 500 |
| වරිපණම් හා රක්ෂණ | 20 | |
| 2019-04-01 ට තොගය | 50 | |
| වෙළඳ ලැබියයුතු දෑ(ණයගැතියන්) | 210 | _ |
| වෙළද ගෙවියයුතු දෑ (ණයහිමියන්) | _ | 100 |
| ගෙවූ බැංකු ණය පොලී | 30 | |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 20 | 30 |
| අනෙකුත් පරිපාලන වියදම් | 45 | |
| ගැනිලි | 30 | |
| ගෙවල් කුලී ආදායම් | _ | 100 |
| මුදල් | 155 | _ |
| ප්‍රාග්ධනය | _ | 2000 |
| | **4270** | **4270** |

අතිරේක තොරතුරු :

1. 2020/03/31 දිනට ව්‍යාපාරයේ තිබූ තොගය රු. 100 000 කට අගය කර ඇත.
2. 2020-03-31 දිනට උපචිත වියදම්
   විදුලි ගාස්තු 8 000 යි ප්‍රචාරණ වියදම් රු 10 000 යි.
   ඉදිරියට ගෙවීම් වරිපණම් හා රක්ෂණ රු 5 000 යි
3. අයිතිකරු රු. 10 000 ක් වටිනා භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගෙන ගොස් ඇත.
4. ගොඩනැගිලි / මෝටර් රථ වාර්ෂිකව පිරිවැය මත පිළිවෙලින් 5% හා 10% බැගින් ක්ෂය කරන්න.
5. රු. 1000 ක් බොල් ණය ලෙස කපා හැර, ඉතිරි ණයගැතියන්ගෙන් 5% ක් අඩමාණ ණය සඳහා වෙන් කරන්න.

අවශ්‍ය වන්නේ

**1) 2020-03-31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

**2) 2020-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

ගැලපුම් සටහන් සඳහා ද්විත්ව සටහන් පහත පරිදි ය.

| ගැලපුම | ද්විත්ව සටහන |
|---|---|
| 1. අවසාන ඉතිරි තොගය | ඉතිරි බඩු තොග ගිණුම (හර)<br>වෙළෙඳ ගිණුම/ආදායම් ප්‍රකාශනය (බැර) |
| 2. භාණ්ඩ ගැනිලි | ගැනිලි ගිණුම (හර)<br>ගැනුම් ගිණුම (බැර) |
| 3. තොග පරිත්‍යාග | තොග පරිත්‍යාග ගිණුම (හර)<br>ගැනුම් ගිණුම (බැර) |
| 4. උපචිත වියදම් | අදාළ වියදම් ගිණුම් (හර)<br>උපචිත වියදම් (බැර) |
| 5. ලැබිය යුතු ආදායම් | ලැබිය යුතු ආදායම් ගිණුම (හර)<br>අදාළ ආදායම් ගිණුම (බැර) |
| 6. ඉදිරියට ගෙවූ වියදම් | ඉදිරියට ගෙවූ වියදම් ගිණුම (හර)<br>අදාළ වියදම් ගිණුම (බැර) |
| 7. කලින් ලද ආදායම් | අදාළ ආදායම් ගිණුම (හර)<br>කලින් ලද ආදායම් ගිණුම (බැර) |
| 8. බොල් ණය | බොල් ණය ගිණුම (හර)<br>ණයගැති පාලන ගිණුම (බැර) |
| 9. අඩමාණ ණය වෙන් කිරීම | අඩමාන ණය ගිණුම (හර)<br>අඩමාන ණය වෙන් කිරීම් ගිණුම (බැර) |
| 10. දේපළ පිරියත ක්ෂය | ක්ෂය ගිණුම (හර)<br>සමුච්චිත ක්ෂය ගිණුම (බැර) |

## විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද භාණ්ඩ

- විකිනීමේ හෝ ආපසු එවීමේ පදනම මත භාණ්ඩ යවන අවස්ථාවේදී ඒවා සම්බන්ධයෙන් සිහිවටන සටහනක් පමණක් ව්‍යාපාරය තබා ගනියි.

- ගණුදෙනුකරු / නියෝජිතයා එම බඩු තොගය විකුණන ලද බව ව්‍යාපාරයට දැනුම් දුන් විට හෝ අදාළ තොග විකිණීමට ඉඩ දුන් කාලසීමාව ඉකුත් ව ඇත්නම් අදාළ වටිනාකම පරිදි ගිණුම්ගත කළ යුතුයි.

ණය ගැති පාලන ගිණුම (හර)

විකුණුම් ගිණුම (බැර)

- ගිනුම් කාලච්ඡේදය අවසාන දින වන විටත් එම බඩු තොගය විකිණී නොමැති නම් අනුමත කාලය ඉකුත්ව නැතිනම් එකී තොගයේ පිරිවැය අවසාන තොගයට එකතු කරන්න.

 නමුත් යවන ලද තොග වැරදීමකින් විකුණුම් ලෙස ගිණුම්ගත වී ඇත්නම් එම ප්‍රමාණය පහත පරිදි ගැලපීම් කළ යුතුයි.

විකුණුම් ගිණුම (හර)

ණයගැති පාලන ගිණුම (බැර)

##  තොග හානි වීම

විකිණීම සඳහා ලබා ගත් තොගයක් ගින්නකින් හෝ වෙනත් හේතුවක් මත හානිවුව හොත් එම හානි වූ තොගයේ පිරිවැය පහත පරිදි වාර්තා කරන්න.

හානි වූ තොග ගිණුම (හර)

ගැනුම් ගිණුම (බැර)

 හානි වූ තොග රක්ෂණය කර තිබුණේ නම් එහි දී දීමට එකඟ වූ රක්ෂණ වන්දිය පහත පරිදි සටහන් කරන්න.

ලැබිය යුතු රක්ෂණ වන්දි ගිණුම (හර)

හානි වූ තොග ගිණුම (බැර)

 හානි වූ තොග ගිණුමේ ශේෂය (අලාභය) ආදායම් ප්‍රකාශනයේ වෙනත් වියදම් යටතේ

**(තනි පුද්ගල ව්‍යාපාර අභ්‍යාස 04)**

සුභසිංහගේ ව්‍යාපාරයේ හා වනාස්ගේ ව්‍යාපාරයේ 2020-03-31 න් අවසන් වර්ෂයට අදාල ශේෂ පිරික්සුම පහත දක්වේ

| | **සුභසිංහ ව්‍යාපාරය** | | **නවාස් ව්‍යාපාරය** | |
|---|---|---|---|---|
| ගිණුමේ නම | හර (රු.) | බැර (රු.) | හර (රු.) | බැර (රු.) |
| ගැණුම් | 80 000 | - | 160 000 | - |
| විකුණුම් | - | 200 000 | - | 400 000 |
| 2019/04/01 තොගය | 8 000 | - | 16 000 | - |
| ආපසු එවුම් | 10 000 | - | 20 000 | - |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රචාරණය | 3 000 | - | 6 000 | - |
| ගෙන ඒමේ කුලී | 2 000 | - | 4 000 | - |
| විදුලි බිල | 5 000 | - | 10 000 | - |
| වැටුප් හා වේතන | 15 000 | - | 30 000 | - |
| 10% බැංකු ණය | - | 50 000 | - | 100 000 |
| ලී බඩු පිරිවැයට | 10 000 | - | 20 000 | - |
| ඉඩම් හා ගොඩනැගිලි පිරිවැයට | 150 000 | - | 300 000 | - |
| මුදල් | 13 500 | - | 27 000 | - |
| විකුණුම් වියදම් | 4 000 | - | 8 000 | - |
| ණයගැතියෝ | 10 000 | - | 20 000 | - |
| ණයහිමියෝ | - | 26 500 | - | 53 000 |
| මෝටර් රථය පිරිවැයට | 75 000 | - | 150 000 | - |
| ගෙවල් කුලී ආදායම් | - | 9 000 | - | 18 000 |
| ප්‍රාග්ධනය | - | 100 000 | - | 200 000 |
| | **385 500** | **385 500** | **771 000** | **771 000** |

අතිරේක තොරතුරු :

* අතිරේක තොරතුරු ව්‍යාපාර දෙකට ම අදාළ වේ.

1. 2020/03/31 දිනට ව්‍යාපාරයේ තිබූ තොගය රු. 13 000 කට අගය කර ඇත.

2. විකිණීම හෝ ආපසු එවීමේ පදනමට යවා ඇති රු. 5 000 ක් පිරිවැය වු භාණ්ඩ ණයට විකුණුම් ලෙස වාර්තා කර ඇත. එහි විකුණුම් මිල රු. 6 000 කි. ඒවා තවම විකිණී නැත.

3. අයිතිකරු රු. 2 000 ක් වටිනා භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගෙන ගොස් ඇත.

4. රු. 5 000 ක් වටිනා තොග හානි වූ අතර එයින් 60% ක රක්ෂණ වන්දි මුදලක් ලැබීමට නියමිත ය.

5. රු. 1000 ක් බොල් ණය ලෙස කපා හැර, ඉතිරි ණයගැතියන්ගෙන් 5% ක් අඩමාණ ණය සඳහා වෙන් කරන්න.

6. 2020/03/31 දිනට උපචිත වියදම්

විදුලි බිල රු. 1 000, ගෙන ඒමේ කුලී රු. 2 000

7. 2020/03/31 දිනට ඉදිරියට ගෙවූ ප්‍රචාරණ වියදම් රු. 2 000

8. 2020/03/31 දිනට කලින් ලද ගෙවල් කුලී ආදායම රු. 4 000

9. ලී බඩු හා මෝටර් රථ පිරිවැය මත පිළිවෙලින් 5% හා 10% බැගින් වාර්ෂික ව ක්ෂය කරන්න.

10. බැංකු ණය 2019.03.31 දින ලබා ගෙන ඇත.

**අවශ්‍ය වන්නේ**

**1 2020-03-31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

**2 2020-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

## සේවක අර්ථසාධක අරමුදල් (EPF), සේවක භාර අරමුදල් (ETF) හා එකතු කළ අගය මත බදු (VAT) හා සම්බන්ධ ගැලපුම් සහිත කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ආකාරය

**(තනි පුද්ගල ව්‍යාපාර අභ්‍යාස 05)**

විමුක්තිගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2020. 03. 31 දිනට උපුටා ගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| ගිණුමේ නම | හර රු | බැර රු |
|---|---|---|
| ඉඩම් පිරිවැයට | 1 000 000 | |
| ගොඩනැගිලි පිරිවැයට | 800 000 | |
| මෝටර් රථ පිරිවැයට | 1 200 000 | |
| සමුච්චිත ක්ෂය (2019. 04. 01 දිනට) | | |
| ගොඩනැගිලි | | 160 000 |
| මෝටර් රථ | | 240 000 |
| ගැනුම් | 345 000 | |
| විකුණුම් - | | 920 000 |
| තොගය (2019. 04. 01) | 30 000 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ (ණයගැතියෝ) | 105 000 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ (ණයහිමියෝ) | 230 000 | |
| වැටුප් හා වේතන (ශුද්ධ) | 72 000 | |

| | | |
|---|---|---|
| අනෙකුත් පරිපාලන වියදම් | 23 000 | |
| 12% බැංකු ණය | | 100 000 |
| ගෙවූ බැංකු ණය පොළී | 9 000 | |
| පරිත්‍යාග | 2 000 | |
| මුදල් | 130 000 | |
| සුළු මුදල් | 10 000 | |
| වට්ටම් | 2 000 | 14 000 |
| ගැනිලි | 5 000 | |
| ප්‍රචාරණ වියදම් | 6 000 | |
| ගෙවූ VAT | 25 000 | |
| ප්‍රාග්ධනය | | 2 100 000 |
| | 3 764 000 | 3 764 000 |

අතිරේක තොරතුරු :

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත සඳහන් ගැලපීම් කළ යුතු වේ.

1. 2020. 3. 31 තොගය පිරිවැයට රු. 120 000 ක් වූ අතර එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 100 000 කි.

2. ගොඩනැගිලි හා මෝටර් රථ පිරිවැය මත 10% බැගින් ක්ෂය කළ යුතු ය.

3. සේවක අර්ථසාධක අරමුදල (EPF) සේවක දායකය 10% ක් වන අතර සේව්‍ය දායකය 15% ක් වේ. සේවක භාර අරමුදල් දායකය (ETF) 3% ක් වේ. EPF සේවක දායකත්වය අඩු කර වැටුප් ගෙවා ඇත. EPF සහ ETF සම්බන්ධයෙන් වෙනත් ගැලපීම් සිදු කර නැත.

4. සියලුම ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදු වේ. ගැනුම් හා විකුණුම් තුළ 15% ක (VAT) ඇතුළත් වේ. ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇත.

5. බොල් ණය ලෙස රු. 5 000 ක් කපා හැරීම කළ යුතු අතර, ඉතිරි ණයගැතියන්ගෙන් 10% ක් අඩමාණ ණය ලෙස වෙන් කිරීමට තීරණය කර ඇත.

6. ඉදිරියට ගෙවන ලද රු. 3 000 ක රක්ෂණ ගාස්තු පරිපාලන වියදම් තුළ ඇතුළත් වේ.

අවශ්‍ය වන්නේ :

1. 2020. 03. 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශනය

2. 2020. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(තනි පුද්ගල ව්‍යාපාර අභ්‍යාස 06)**

**සහන්ගේ ව්‍යාපාරයේ 2020-03-31 න් අවසන් වර්ෂයට අදාල ශේෂ පිරික්සුම පහත දැක්වේ**

**රු (000) වලින්**

| ගිණුමේ නම | රු | රු |
|---|---|---|
| ඉඩම් පිරිවැය | 1000 | _ |
| ගොඩනැගිලි පිරිවැය | 800 | |
| මොටර් රථ පිරිවැය | 1200 | |
| සමුච්චිත ක්ෂය 2019-04-01 දිනට | | |
| ගොඩනැගිලි | | 120 |
| මෝටර් රථ | | 200 |
| ගැණුම් හා විකුණුම් | 575 | 1380 |
| ආපසු එවුම් | 30 | _ |
| ආපසු යැවුම් | _ | 20 |
| ගෙනඒමේ කුලී | 40 | _ |
| ප්‍රචාරණය වියදම් | 50 | _ |
| විදුලි වියදම් | 30 | _ |
| වැටුප් හා වේතන (ශුද්ධ) | 81 | _ |
| 10% බැංකු ණය | _ | 600 |
| වරිපණම් හා රක්ෂණ | 20 | |
| 2019-04-01 ට තොගය | 50 | |
| වෙළඳ ලැබියයුතු දෑ(ණයගැතියන්) | 210 | _ |
| වෙළඳ ගෙවියයුතු දෑ (ණයහිමියන්) | _ | 100 |
| ගෙවූ බැංකු ණය පොලී | 40 | |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 25 | 30 |
| අනෙකුත් බෙදාහැරීමේ වියදම් | 50 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 45 | |
| ගැනිලි | 30 | |
| ගෙවල් කුලී ආදායම් | _ | 100 |
| ගෙවූ VAT | 80 | |
| පරිත්‍යාග | 20 | |
| මුදල් | 174 | _ |
| ප්‍රාග්ධනය | _ | 2000 |
| | **4550** | **4550** |

***අතිරේක තොරතුරු :***

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත සඳහන් ගැලපීම් කළ යුතු වේ.

1. 2020. 3. 31 තොගය පිරිවැයට රු. 100 000 ක් වූ අතර එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය

රු. 90 000 කි.

2. ගොඩනැගිලි පිරිවැය මත 5% හා මෝටර් රථ හීනවන ශේෂ ක්‍රමය මත 10% බැගින් ක්ෂය කළ යුතු ය.

3. සේවක අර්ථසාධක අරමුදල (EPF) සේවක දායකය 10% ක් වන අතර සේව්‍ය දායකය 15% ක් වේ. සේවක භාර අරමුදල් දායකය (ETF) 3% ක් වේ. EPF සේවක දායකත්වය අඩු කර වැටුප් ගෙවා ඇත. EPF සහ ETF සම්බන්ධයෙන් වෙනත් ගැලපීම් සිදු කර නැත.

4. සියලුම ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදු වේ. ගැනුම් හා විකුණුම් තුළ 15% ක (VAT) ඇතුළත් වේ. ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇත.

5. බොල් ණය ලෙස රු. 10 000 ක් කපා හැරීම කළ යුතු අතර, ඉතිරි වෙළඳ ලැබියයුතු දෑ මත 10% ක් අඩමාණ ණය ලෙස වෙන් කිරීමට තීරණය කර ඇත.

6. ඉදිරියට ගෙවන ලද රක්ෂණ ගාස්තු රු. 3 000

අවශ්‍ය වන්නේ :

1. 2020. 03. 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශනය

2. 2020. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

## (තනි පුද්ගල ව්‍යාපාර අභ්‍යාස 07)

**සීමිත සල්ගාදු ව්‍යාපාරයේ 2020-03-31 ට ව්‍යාපාරයෙන් උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ**

රු(000)

| ගිණුමේ නම | රු | රු |
|---|---|---|
| ඉඩම් පිරිවැය | 1500 | _ |
| ගොඩනැගිලි පිරිවැය | 1000 | |
| මොටර් රථ පිරිවැය | 2000 | |
| ගෘහ භාණ්ඩ පිරිවැය | 500 | |
| සමුච්චිත ක්ෂය 2020-04-01 දිනට | | |
| ගොඩනැගිලි | | 400 |
| මෝටර් රථ | | 500 |
| ගෘහ භාණ්ඩ | | 100 |
| ගැණුම් හා විකුණුම් | 920 | 2300 |
| ආපසු එවුම් | 100 | _ |
| ආපසු යැවුම් | _ | 60 |
| ගෙනඒමේ කුලී | 40 | _ |
| ප්‍රචාරණය වියදම් | 50 | _ |
| විදුලි වියදම් | 30 | _ |
| වැටුප් හා වේතන (ශුද්ධ) | 132 | _ |
| 10% බැංකු ණය | _ | 1000 |
| වරිපණම් හා රක්ෂණ | 20 | |
| 2019-04-01 ට තොගය | 80 | |
| වෙළඳ ලැබියයුතු දෑ(ණයගැතියන්) | 320 | _ |
| වෙළඳ ගෙවියයුතු දෑ (ණයහිමියන්) | _ | 150 |
| ගෙවූ බැංකු ණය පොලී | 60 | |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 30 | 40 |
| අනෙකුත් බෙදාහැරීමේ වියදම් | 70 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 50 | |
| ගැනිලි | 25 | |
| ගෙවල් කුලී ආදායම් | _ | 180 |
| ගෙවූ VAT | 120 | |
| පරිත්‍යාග | 50 | |
| මුදල් | 133 | _ |
| ප්‍රාග්ධනය | _ | 2500 |
| | **7230** | **7230** |

***අතිරේක තොරතුරු :***

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත සඳහන් ගැලපීම් කළ යුතු වේ.

1. 2020. 03. 31 තොගය පිරිවැයට රු. 160 000 ක් වූ අතර එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය

රු. 130 000 කි.

2. ගොඩනැගිලි පිරිවැය මත 5% ක්ද , ගෘහ භාණ්ඩ පිරිවැයට 10% ක් ද හා මෝටර් රථ හීනවන ශේෂ ක්‍රමය මත 15% බැගින් ක්ෂය කළ යුතු ය.

3. සේවක අර්ථසාධක අරමුදල (EPF) සේවක දායකය 10% ක් වන අතර සේව්‍ය දායකය 15% ක් වේ. සේවක භාර අරමුදල් දායකය (ETF) 3% ක් වේ. EPF සේවක දායකත්වය අඩු කර වැටුප් ගෙවා ඇත. EPF සහ ETF සම්බන්ධයෙන් වෙනත් ගැලපීම් සිදු කර නැත.

4. සියලුම ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදු වේ. ගැනුම් හා විකුණුම් තුළ 15% ක (VAT) ඇතුළත් වේ. ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇත.

5. බොල් ණය ලෙස රු. 20 000 ක් කපා හැරීම කළ යුතු අතර, ඉතිරි වෙළඳ ලැබියයුතු දෑ මත 10% ක් අඩමාණ ණය ලෙස වෙන් කිරීමට තීරණය කර ඇත.

6. ඉදිරියට ගෙවන ලද රක්ෂණ වරිපණම් ගාස්තු රු. 4 000 කි.

අවශ්‍ය වන්නේ :

1. 2020. 03. 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශනය

2. 2020. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(තනි පුද්ගල ව්‍යාපාර අභ්‍යාස 08)

සීමිත රෝයල් ව්‍යාපාරයේ 2020-03-31 ට ව්‍යාපාරයෙන් උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ

රු(000)

| ගිණුමේ නම | රු | රු |
|---|---|---|
| ඉඩම් පිරිවැය | 1200 | _ |
| ගොඩනැගිලි පිරිවැය | 1000 | |
| මොටර් රථ පිරිවැය | 1500 | |
| සමුච්චිත ක්ෂය 2019-04-01 දිනට | | |
| ගොඩනැගිලි | | 200 |
| මෝටර් රථ | | 500 |
| ගැනුම් හා විකුණුම් | 1035 | 2070 |
| ආපසු එවුම් | 46 | _ |
| ආපසු යැවුම් | _ | 69 |
| ගෙනඒමේ කුලී | 40 | _ |
| ප්‍රචාරණය වියදම් | 60 | _ |
| විදුලි වියදම් | 25 | _ |
| වැටුප් හා වේතන (ශුද්ධ) | 90 | _ |
| 10% බැංකු ණය | _ | 800 |
| වරිපණම් හා රක්ෂණ | 30 | |
| 2019-04-01 ට තොගය | 120 | |
| වෙළඳ ලැබියයුතු දෑ(ණයගැතියන්) | 220 | _ |
| වෙළඳ ගෙවියයුතු දෑ (ණයහිමියන්) | _ | 120 |
| ගෙවූ බැංකු ණය පොලී | 60 | |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 30 | 40 |
| අනෙකුත් බෙදාහැරීමේ වියදම් | 70 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 45 | |
| 2019-04-01 ට අඩමාණ ණය වෙන් කිරිම | | 15 |
| ගැනිලි | 30 | |
| ගෙවල් කුලී ආදායම් | _ | 100 |
| ගෙවූ VAT | 85 | |
| පරිත්‍යාග | 20 | |
| මුදල් | 208 | _ |
| ප්‍රාග්ධනය | _ | 2000 |
| | **5914** | **5914** |

***අතිරේක තොරතුරු :***

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත සඳහන් ගැලපීම් කළ යුතු වේ.

1. 2020. 3. 31 තොගය පිරිවැයට රු. 150 000 ක් වූ අතර එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 140 000 කි.

2. ගොඩනැගිලි පිරිවැය මත 5% ක්ද , මෝටර් රථ හීනවන ශේෂ ක්‍රමය මත 20% බැගින් ක්ෂය කළ යුතු ය.

3. සේවක අර්ථසාධක අරමුදල (EPF) සේවක දායකය 10% ක් වන අතර සේව්‍ය දායකය 15% ක් වේ. සේවක භාර අරමුදල් දායකය (ETF) 3% ක් වේ. EPF සේවක දායකත්වය අඩු කර වැටුප් ගෙවා ඇත. EPF සහ ETF සම්බන්ධයෙන් වෙනත් ගැලපීම් සිදු කර නැත.

4. සියලුම ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදු වේ. ගැනුම් , විකුණුම්, ආපසු එවුම් හා ආපසු යැවුම් තුළ 15% ක (VAT) ඇතුළත් වේ. ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇත.

5. බොල් ණය ලෙස රු. 20 000 ක් කපා හැරීම කළ යුතු අතර, ඉතිරි වෙළඳ ලැබියයුතු දෑ මත 10% ක් අඩමාණ ණය ලෙස වෙන් කිරීමට තීරණය කර ඇත.

6. ඉදිරියට ගෙවන ලද රක්ෂණ වරිපණම් ගාස්තු රු. 5000 කි.

අවශ්‍ය වන්නේ :

1. 2020. 03. 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශනය

2. 2020. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(තනි පුද්ගල ව්‍යාපාර අභ්‍යාස 09)**

සීමිත සුනෙත්ගේ ව්‍යාපාරයේ 2020-03-31 ට ව්‍යාපාරයෙන් උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ

රු(000)

| ගිණුමේ නම | රු | රු |
|---|---|---|
| ඉඩම් පිරිවැය | 1200 | _ |
| ගොඩනැගිලි පිරිවැය | 1000 | |
| මොටර් රථ පිරිවැය | 1500 | |
| ගෘහභාණ්ඩ පිරිවැය | 500 | |
| පරිගණක පිරිවැය | 200 | |
| සමුච්චිත ක්ෂය 2019-04-01 දිනට | | |
| ගොඩනැගිලි | | 200 |
| මෝටර් රථ | | 500 |
| ගෘහභාණ්ඩ | | 100 |
| පරිගණක | | 20 |
| ගැණුම් හා විකුණුම් | 700 | 1600 |
| ආපසු එවුම් | 40 | _ |
| ආපසු යැවුම් | _ | 30 |
| ගෙනඒමේ කුලී | 20 | _ |
| ප්‍රචාරණය වියදම් | 60 | _ |
| විදුලි වියදම් | 20 | _ |
| වැටුප් හා වේතන | 100 | _ |
| 10% බැංකු ණය | _ | 500 |
| ගෙවියයුතු EPF සේවක දායකය | | 10 |
| වරිපණම් හා රක්ෂණ | 30 | |
| 2019-04-01 ට තොගය | 100 | |
| වෙළඳ ලැබියයුතු දෑ(ණයගැතියන්) | 155 | _ |
| වෙළඳ ගෙවියයුතු දෑ (ණයහිමියන්) | _ | 80 |
| ගෙවූ බැංකු ණය පොලී | 40 | |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 20 | 30 |
| අනෙකුත් බෙදාහැරීමේ වියදම් | 55 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 50 | |
| 2019-04-01 ට අඩමාණ ණය වෙන් කිරිම | | 15 |
| ගැනිලි | 30 | |
| ලද ගෙවල් කුලී ආදායම් | _ | 144 |
| අනෙකුත් මූල්‍ය හා වෙනත් වියදම් | 45 | |
| පරිත්‍යාග | 20 | |
| මුදල් | 344 | _ |
| ප්‍රාග්ධනය | _ | 3000 |
| | **6229** | **6229** |

***අතිරේක තොරතුරු :***

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත සඳහන් ගැලපීම් කළ යුතු වේ.

1. 2020. 3. 31 තොගය පිරිවැයට රු. 100 000 ක් වූ අතර එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය

රු. 90 000 කි.

2. ගොඩනැගිලි පිරිවැය මත 5% ක්ද , ගෘහ භාණ්ඩ පිරිවැයට 10% ක් ද හා මෝටර් රථ හා පරිගණක සරල මාර්ග ක්‍රමය මත පිළිවෙලින් 20%,10% බැගින් ක්ෂය කළ යුතු ය.

3. සේවක අර්ථසාධක අරමුදල (EPF) සේවක දායකය 10% ක් වන අතර සේව්‍ය දායකය 15% ක් වේ. සේවක භාර අරමුදල් දායකය (ETF) 3% ක් වේ. EPF සේවක දායකත්වය ගෙවියයුතු EPF ගිණුමකට බැරකර ඇත. EPF සහ ETF සම්බන්ධයෙන් වෙනත් ගැලපීම් සිදු කර නැත.

4. 2016-04-01 මිලටගත් පිරිවැය රු 300 000 ක් වටිනා මෝටර් රථයක් 2020-03-31 දින රු 200 000 කට විකුණා ඇති අතර ඒ සම්බන්ධයෙන් කිසිදු සටහනක් තබා නැත.

5. වෙළඳ ලැබියයුතු දෑ මත බොල් ණය ලෙස රු. 25 000 ක් කපා හැරීම කළ යුතු අතර, ඉතිරි වෙළඳ ලැබියයුතු දෑ මත 10% ක් අඩමාණ ණය ලෙස වෙන් කිරීමට තීරණය කර ඇත.

6. 2019-04-01 දින ව්‍යාපාරයේ ගොඩනැගිල්ලක් කුලියට දී මාස 18 ක කුලී ලබාගෙන ඇත.

අවශ්‍ය වන්නේ :

1. 2020. 03. 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශනය

2. 2020. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය